ඕකයි තත්ත්වේ

ජනපති රනිල්ගේ සෙනෙහස කුළුගන්නා
අගමැති 'බොරළුගොඩ' තම දිවුරුම දුන්නා
සමහරු අඬන විට අරගල බිම පෙන්නා
අලි සුරතල්ම බල බල වුණි එම දෙන්නා

- අනුරාධ

ළමා ප්‍රතිශක්තිකරණය බිඳ වැටීමේ අවදානමක්

සෞඛ්‍ය සේවා නිලධාරීන්ගේ සංගමයේ සභාපතිනී දේවිකා කොඩිතුවක්කු

මාතලේ විශේෂ නිමල් ගුණතිලක

ඉන්ධන හිඟය නිසා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් කාර්යාල සේවාවට පමණක් සීමාවීමට ගෙන ඇති තීරණයත් සමග ප්‍රතිශක්තිකරණ වැඩ සටහන, ත්‍රිපෝෂ බෙදා හැරීම, ගැබිනි සහ කිරි දෙන මවුවරුන්ගේ සෞඛ්‍යය තත්ත්වයන් මෙන්ම ළදරු සහ ළමුන්ගේ සෞඛ්‍යය තත්ත්වය සොයා බැලීම ද සම්පූර්ණයෙන්ම බිඳ වැටීමේ අවදානමක් හටගෙන තිබේ.

රජයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්ගේ සංගමයේ සභාපතිනී දේවිකා කොඩිතුවක්කු මහත්මිය පැවැසුවේ කේෂත්‍ර රාජකාරී සඳහා යතුරු පැදිවලට ප්‍රමාණවත් ඉන්ධන නොලැබීම නිසා සිය සාමාජිකත්වය කාර්යාල ගත සේවාවට පමණක් සීමාවීමට තීරණයක් ගෙන ඇති බවය. රට පුරා කේෂත්‍ර ගත රාජකාරීවල පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් 9000ක් රාජකාරිවල නියුතුව සිටින බව කී ඇය මාතෘ මරණ සහ ළදරු මරණ අඩුම සහ ප්‍රතිශක්තිකරණයෙන් ඉහළම ආසියානු කලාපයේ රට ලෙස ශ්‍රී ලංකාව ලෝක සෞඛ්‍ය සංවිධානය පිළිගෙන ඇති බවත් පැවැසුවාය.

බුත්තල ඉන්ධන පිරවුමක රථය නවතා පා ගමනින් යමින් සිටි විශ්‍රාමික සෙබළා රිය අනතුරකින් මරුට

බඩල්කුඹුර රවිඳු ගුණතිලක

බුත්තල, වැල්ලවාය මාර්ගයේ රාජපක්ෂ හංදිය අසලදී සිදු වූ රිය අනතුරකින් පාගමනින් යමින් සිටි විශ්‍රාමික යුද හමුදා සෙබළකු යතුරුපැදියක ගැටීමෙන් මිය ගොස් ඇතැයි බුත්තල පොලිසිය පවසයි.

මෙලෙස මිය ගොස් ඇත්තේ බුත්තල රජ මාවත පෙට්ටගම්වෙල විමලතුංග පාර පදිංචි විද්‍යාරත්න ගණිතයලාගේ විද්‍යාරත්න (45) නමැති දෙදරු පියෙකි.

හෙතෙම සිය මෝටර් රථය ඉන්ධන ලබාගැනීම සඳහා බුත්තල නගරයේ පිහිටි ඉන්ධන පිරවුම්හලකට රැගෙනවිත් එහි නතර කොට පාගමනින් ආපසු නිවසට යමින් සිටියදී බුත්තල දෙසින් පැමිණි යතුරුපැදියක් ඔහුව යටකරගෙන ගොස් ඇත. පැදිකරු යතුරුපැදිය දමා පලාගොස් තිබේ. තුවාලකරු බුත්තල ප්‍රාදේශීය රෝහලට ඇතුළත් කරන විටත් මියගොස් සිටි බව පරීක්ෂණවලදී අනාවරණයවී ඇත. බුත්තල පොලිස් ස්ථානාධිපති ඩබ්ලිව්. එම්. ජේ. බණ්ඩාර මහතා සිද්ධිය පිළිබඳ පරීක්ෂණ පවත්වයි.

දුම්රිය ගාස්තු නංවනු ඒපා

මුහුදු බඩ දුම්රිය මගී සංගමය

හිනිදුම - රවීන්ද්‍ර චන්ද්‍රලාල්, ලලිත් චාමින්ද සහ එස්.කේ. කළුආරච්චි

අප රටේ ජනතාව දහසකුත් කරදරවලට මුහුණ පා ඇති මෙම වකවානුවේ දුම්රිය ගාස්තු වැඩි නොකරන ලෙස මුහුදු බඩ දුම්රිය මගී සංගමය ඉල්ලා සිටී.

එම සංගමයේ සභාපති ගුණපාල ජනාධි විතාරණ මහතා මෙම ඉල්ලීම කළේ ගාල්ල දක්ෂිණ ලංකා මාධ්‍ය මධ්‍යස්ථානයේ දී පැවැති මාධ්‍ය හමුවකදීය. දුම්රිය ගාස්තු වැඩි කරන්න යනවා. මේක කරන්න එපා. මේ ගාස්තු වැඩිකිරීම තව ටික කාලයකට හරි ප්‍රමාද කරන්න. දැන් ජනතාව කරදරවලින් මිරිකිලා. ගමනක් යන්න දුම්රිය විතරයි තිබුණේ.

පහුගිය දවස්වල අපි දැක්කා ජනතාව දුම්රියේ එල්ලිලා, වහලේ නැගලා යනවා. දුම්රිය නැතිවුණොත් ජනතාවට කරන්න දෙයක් නැති වේවි. අද බස් අඩුයි. බස්වල ජනතාව යන්නේ මිරිකිලා. ඉන්ධන නැති නිසා ජනතාවට දුම්රිය යම් සහනයක් වුණා. මේ යන විදියට ඒ සහනයත් නැතිවෙන හැඩයි.

බස් ගාස්තු වැඩි නිසා ජනතාව දුම්රියේ ගමන් කරන්න පුරුදු වුණා. දුම්රිය කියන්නේ සේවයක් කරන දෙපාර්තමෙන්තුවක්, මුදල් උපයන දෙපාර්තමේන්තුවක් නෙමෙයි. ඒ නිසා ගත්ත තීරණය වෙනස් කරලා කබලෙන් ළිපට වැටුණු මිනිස්සුන්ට සහනයක් වෙන්න කියලා ඉල්ලා සිටිනවා, යැයි ගුණපාල විතාරණ මහතා කියා සිටියේය.

රත්තනපිටියේ ඩෙංගු අවදානම ඉහළට

බොරලැස්ගමුව මහජන සෞඛ්‍ය පරීක්ෂක ළහිරු ද සිල්වා

ප්‍රදීප් ප්‍රසන්න සමරකෝන් සහ ඥානතිස්ස ජයවර්ධන
බොරලැස්ගමුව

මෙම මාසයේ ගත වූ දින 18ක කාලය තුළ ඩෙංගු රෝගීන් 38 දෙනකු බොරලැස්ගමුව නගර සභා සීමාවෙන් වාර්තා වන බව බොරලැස්ගමුව මහජන සෞඛ්‍ය පරීක්ෂක ළහිරු ද සිල්වා මහතා පැවැසීය. එමෙන්ම කොවිඩ් ආරම්භ වූ 2020 මාර්තු සිට මේ දක්වා ගතවූ කාලය තුළ කොවිඩ් රෝගීන් හයදහස් හැට දෙදෙනකු වාර්තා වන බවද හෙතෙම කීය.

බොරලැස්ගමුව නගර සභා මාසික මහා සභාව කාරක සභාවක් බවට පත්කළ අවස්ථාවේ බොරලැස්ගමුව නගර සීමාවේ ඩෙංගු සහ කොවිඩ් වත්මන් තත්ත්වය පැහැදිලි කරමින් ඔහු එසේ පැවසීය. මෙහිදී තවදුරටත් කතා කළ ඒ මහතා, දැන් නැවතත් වැසි තත්ත්වය ආරම්භ වෙලා.

ඒත් එක්කම ඩෙංගු වර්ධනය වෙනවා. මේ මාසයට වාර්තා වී ඇති ඩෙංගු රෝගීන් 38 දෙනාගෙන් 11 රත්තනපිටියෙන් වාර්තා වෙලා තියෙනවා. අනිත් වැඩිම සංඛ්‍යාව ඉන්නේ පැපිලියානේ. ඒ සංඛ්‍යාව 10ක්.

දඹුල්ල ආර්ථිකයට වැඩි මිලට විකිණීමට ගෙන යමින් සිටි ඉන්ධන තොගයක් දැලේ

කන්තලේ ඩබ්. එම්. වික්‍රමසිංහ

කන්තලේ සිට දඹුල්ල දක්වා ගමන් ගත් ලොරි රථයක තිබී ඩීසල් හා පෙට්‍රල් තොගයක් අත්අඩංගුවට ගත් බව කන්තලේ පොලිසිය පැවසීය. මේ අනුව ඩීසල් ලීටර් 520 ක් හා පෙට්‍රල් ලීටර් 5 ක් ද සමගින් දඹුල්ලේ පදිංචිකරුවකු අත්අඩංගුවට ගෙන ඇත.

දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට ගෙන ගොස් වැඩි මිලට විකිණීම සඳහා දැනට කාලයක් තිස්සේම මෙම ජාවාරම කරගෙන යන බවට තොතුරු ලැබී ඇති බව සඳහන් කරන පොලිසිය ප්‍රදේශවාසීන් කීපදෙනකුගෙන්ම ලද තොරතුරු මත ඔහු අත්අඩංගුවට ගත් බව පැවසීය. සැකකරු අධිකරණය හමුවට පැමිණවීමට නියමිතව තිබුණි.

කන්තලේ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි අශෝක වීරක්කොඩි මහතාගේ නියෝග මත සහකාර පොලිස් අධිකාරි 1 රෝහණ වනිගසේකර මහතාගේ අධීක්ෂණය මත කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක ප්‍රදීප් කුමාර, පොලිස් සැරයන් රංගජීව (3365), පොලිස් කොස්තාපල්වරුන් වන පෙරේරා (48442), ප්‍රසාද් (32844), ගමගේ (69176) යන නිලධාරීන් වැටලීම සිදුකොට තිබේ.

ඇරැව්වල ගබඩාවක් බිඳ ලක්ෂ 25ක නිමි ඇඳුම් සොරාගත් අය මාට්ටු

ප්‍රදීප් ප්‍රසන්න සමරකෝන් සහ ප්‍රභාත් විතාන

මහරගම ඇරැව්වල ප්‍රදේශයේ රෙදිපිළි ව්‍යාපාරිකයකුගේ රෙදිපිළි ගබඩාවක් බිඳ රුපියල් ලක්ෂ 25 කට අධික වටිනාකමින් යුත් නිමි ඇඳුම් සොරාගත් සැකකරුවකු පෙරේදා (21දා) මහරගම පොලිසිය මගින් අත්අඩංගුවට ගන්නා ලදී.

ලැබුණු තොරතුරකට අනුව සැකකරු ඇරැව්වල කොස්ගහහේන ප්‍රදේශයේදී කොටුකරගෙන ඇති අතර අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ සැකකරු සන්තකයේ මත් කුඩු ග්‍රෑම් 5යි මිලිග්‍රෑම් 200ක් තිබී පොලිස් භාරයට ගෙන ඇත.

සැකකරු සොරාගත් ඩෙනිම් කලිසම් 909ක්, වතුර මෝටරයක්, වයර් රෝලක්, නිමි ඇඳුම් අලෙවි කර උපයාගත් රුපියල් ලක්ෂ 2 කට ආසන්න මුදලක් පොලිස් භාරයට ගෙන ඇත.41 හැවිරිදි සැකකරු පන්නිපිටිය ප්‍රදේශයේ පදිංචි අයෙකි. මත්කුඩු පානයට ඇබ්බැහිවූ සැකකරු නුගේගොඩ මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි. මහරගම පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක රමේෂ් රත්නසිංහ මහතාගේ උපදෙස් මත අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂකඑල්. ඒ. කේ. සියඹලාගොඩ මහතාගේ මෙහෙයවීමෙන් පොලිස් සැරයන්වරුන් වන සුරංජිත් (43672), සුගතදාස (18478), කාන්තා පොලිස් සැරයන් දීපානි (5497) ඇතුළු නිලධාරීහු වැඩිදුර පරීක්ෂණ සිදු කරති.

සුදත් පෙරේරා නීතිඥ සමාගම 20 වැනි සංවත්සරය සමරයි

සුදත් පෙරේරා ඇසෝසියේට්ස් නීතිඥ සමාගමේ 20 වන සංවත්සරය පසුගියදා සමරන ලදී. රට තුළ පවතින අභියෝගාත්මක ආර්ථික තත්ත්වය සැලකිල්ලට ගනිමින් ආයතනික සමාජයීය වගකීම් ව්‍යාපෘති කිහිපයක් ඊට සමගාමීව ක්‍රියාවට නංවන ලදී. නීතිඥ සුදත් පෙරේරා මහතා 2002 වර්ෂයේදී ඇරඹූ සුදත් පෙරේරා ඇසෝසියේට්ස් නීතිඥ සමාගමේ ප්‍රධාන කාර්යාලය නාවල පිහිටා ඇති අතර ප්‍රවීණ නීතිඥයින් 51 දෙනෙක්, හවුල්කරුවන් 13 දෙනෙක් සහ අනුබද්ධ සමාගම් 13 ක් ඇතුළුව 100 දෙනෙකුට අධික කාර්ය මණ්ඩලයකින් සමන්විත වේ.

පේරලන්ද සාන්ත ජෝශප් විද්‍යාලයට සොර බියක්

කදාන රුක්මන් පින්තු

රාගම පොලිස් බල ප්‍රදේශයේ පිහිටි පේරලන්ද සාන්ත ජෝශප් විද්‍යාලය 9 වතාවක් සොරු බිඳ ලක්ෂ 7ක පමණ භාණ්ඩ රැගෙන ගොස් ඇතැයි වාර්තා වේ.

පාසල අවට මත්ද්‍රව්‍ය ලෝලීන් මෙලෙස පාසලේ දේපළ සොරාගෙන ඇතැයි චෝදනා කරන දෙමාපියන් සොරු පිළිබඳ තොරතුරු පොලිසියට ලබාදී ඇතත්, මෙතෙක් සොරුන් නිදැල්ලේ සිටීම පිළිබඳ ඔවුහු මවිතයට පත් වී සිටිති. මේ පිළිබඳ රාගම පොලිසියෙන් අප කරුණු සොයා බැලීමේදී හෙළිවූයේ ඉන්ධන අර්බුදය හේතුවෙන් සැකකරුවන් අත්අඩංගුවට ගැනීම ප්‍රමාද වී ඇති බවයි. මෙලෙස සොරුන්ගෙන් එල්ල වන දැඩි බලපෑම හේතුවෙන් පාසල පවත්වාගෙන යෑමට නොහැකි තත්ත්වයක් උදා වී ඇතැයි දෙමාපියෝ ප්‍රකාශ කරති.

සූරියවැව සිමෙන්ටිකෝ ඉන්ධන හලේ සාමකාමී තත්ත්වයක්

මත්තල දිලීප් එන්. ජයසේකර

මාසයකට පමණ ආසන්න කාලයකින් පසු සූරියවැව මීගහජඳුර පාරේ පිහිටි සිමෙන්ටිකෝ ඉන්ධන පිරවුම් හලට ඉන්ධන පැමිණි අතර ඉන්ධන බෙදාහැරීමේදී ජනතාව අතර ගැටුම් ඇතිවීම වැළැක්වීමට සූරියවැව පොලිසිය හා මත්තල ගුවන් හමුදා කඳවුරේ නිලධාරීන් එක්ව නිසි වැඩපිළිවෙළක් සකස් කර තිබීම ඉන්ධන ලබාගැනීමට පැමිණි ජනතාවගේ දැඩි ප්‍රශංසාවට ලක් විය.

පෝලිම්වල රැඳී සිටි සියලුම දෙනා ඉතා සාමකාමීව ඉන්ධන ලබා ගැනීමට පැමිණෙන අයුරුද එහි ගිය අපට දැකිය හැකි වූ අතර ජනතා අදහස්වලටද කන් දෙමින් සූරියවැව පොලිසිය හා මත්තල ගුවන් හමුදා කඳවුරේ නිලධාරීන් විසින් ඉටුකළ සේවයත් නව ජනපතිවරයා පත් වීමෙන් පසු මෙලෙස ප්‍රමාණවත් පරිදි ඉන්ධන ලැබීමත් ජනතාවගේ ප්‍රශංසාවට ලක්ව තිබේ. සූරියවැව නගර සීමාවේ ඉන්ධන හල් තුනක් පිහිටා ඇති අතර ඉන් ඉන්ධන හල් දෙකකටම ඉන්ධන ලැබී තිබුණි.

බීමත් අයකුගේ පහරක් නිසා ජයන්තිපුර රෝහල තාවකාලික වසා දමයි

කරුණාරත්න ගමගේ සහ අතුල සූරියබණ්ඩාර හිඟුරක්ගොඩ

පොළොන්නරුව ජයන්තිපුර ග්‍රාමීය සහ පුනරුත්ථාපන රෝහලේ රාජකාරි කරමින් සිටි වෛද්‍යවරයකුට බීමත් පුද්ගලයකු විසින් පහරදීමක් සිදුකර ඇතැයි මින්නේරිය පොලිසිය කියයි. මෙම පහරදීම සිදුකර ඇත්තේ වෛද්‍යවරයාගේ නිල කාමරය තුළදී බව පොලිසිය සිදුකළ විමර්ශනවලදී අනාවරණයවී තිබේ. පහරකෑමට ලක්වූ වෛද්‍යවරයා ප්‍රතිකාර සඳහා පොළොන්නරුව මහ රෝහලට ඇතුළත් කර ඇත.

වෛද්‍යවරයාට පහරදුන් බව කියන පුද්ගලයා මේ වනවිට අත්අඩංගුවට ගෙන ඇතැයි විමර්ශන සිදු කරන පොලිස් නිලධාරීහු පැවැසූහ. අධික ලෙස බීමත්ව සිටි සැකකරු රෝහලට පැමිණ ඇත්තේ ළමයෙකුට ප්‍රතිකාර ගැනීම සඳහා බව පොලිසියට ප්‍රකාශ කර තිබේ. රාජකාරියේ නිරත වෛද්‍යවරයකුට අමානුෂික ලෙස පහරදීමේ සිද්ධිය හේතුවෙන් ජයන්තිපුර රෝහලේ වෛද්‍යවරුන්, හෙද හෙදියන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලය සිය රාජකාරිවලින් ඉවත්ව ඇතැයි පොළොන්නරුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, විශේෂඥ වෛද්‍ය ඩබ්ලිව්. එම්. එස්. කුමාරවංශ මහතා ප්‍රකාශ කළේය. ඒ හේතුවෙන් රෝහලේ නේවාසිකව සිටි රෝගීන් සියලුම දෙනා වෙනත් රෝහල් වලට මාරුකර යවා රෝහල තාවකාලිකව වසා දැමීමට පියවර ගෙන තිබේ. මෙම රෝහලේ වෛද්‍යවරුන් 05 දෙනකු දැනට සේවය කරන බවද එම වෛද්‍යවරුන් සියලුම දෙනා තවදුරටත් එම රෝහලේ රාජකාරි කිරීමට බියක් දක්වන බවත් ඔවුන් වෙනත් රෝහල්වලට ස්ථාන මාරුවීම් ඉල්ලා සිටින බවද ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා පැවැසීය.

පළාත් පාලන ආයතන විසුරුවා මුදල් ජනතා සහනයට යෙදීම කාලෝචිතයි

නිවිතිගල ප්‍රාදේශීය සභාවේ සභාපති කුලතුංග ලියනගේ

නිවිතිගල ධර්මසිරි ජයවර්ධන

පළාත් පාලන නියෝජිතයන්ට දීමනා ගෙවීම සඳහා රජයට විශාල මුදලක් මාසිකව වැය කිරීමට සිදුවී තිබෙනවා. අද පළාත් පාලන නියෝජිත සංඛ්‍යාව දෙගුණ වී ඇති නිසා මෙයට වැය කරන මුදල් ප්‍රමාණය මහජන සුබ සිද්ධිය සඳහා යොදවා පළාත් පාලන ආයතන විසුරුවා හැර එමගින් ඉතිරි වන කෝටි ගාණක මුදල ජනතාවට සහන සැපයීමට යොදා ගැනීම කාලෝචිත බව තම අදහස බවට නිවිතිගල ප්‍රාදේශීය සභාවේ සභාපති කුලතුංග ලියනගේ මහතා (ශ්‍රී.ලං.පො.පෙ.) ප්‍රකාශ කර සිටියේය.

නිවිතිගල ප්‍රාදේශීය සභා මාසික සැසිවාරයේදී තවදුරටත් අදහස් දැක්වූ ඒ මහතා වර්තමානයේ රට වැටී ඇති තත්ත්වය අපි සියලුදෙනාම වටහා ගෙන විසඳුමකට සහය ලබා දිය යුතුව ඇතැයිද පැවසීය.

ගලේවෙලට කන්න තුනකට පසු යූරියා ලැබිලා

ගලේවෙල විශේෂ

ගලේවෙල ගොවි ජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශයේ ගොවීන්ට අවශ්‍ය යූරියා පොහොර මිටි 1,000ක් පමණ ලැබී ඇති බව එහි නිලධාරිණියක් පැවැසුවා ය. ප්‍රදේශයේ ගොවි සංවිධාන විසින් මුදල් ගෙවා ඇති පිළිවෙළ අනුව යූරියා පොහොර නිකුත් කරනු ඇත. යූරියා කිලෝ 50ක මිටියක මිල රුපියල් 10,000ක් වන අතර අදාළ බල ප්‍රදේශයේ හෙක්ටයාර් 1,200ක පමණ වී වගාව සිදුකෙරේ.

ඊට අවශ්‍ය යූරියා පොහොර මිටි ප්‍රමාණය 2,400ක් පමණ වේ. ඉතිරි පොහොර මිටි ප්‍රමාණය ඉදිරියේදී ලැබීමට නියමිත බව වාර්තාවේ. කන්න 03කට පසු තමන්ට යූරියා පොහොර ලබාදීමට පියවර ගැනීම ගැන ගොවීහු රජයට සිය කෘතඥතාවය පළකර සිටිති.